**ශ්‍රී ලංකා ගණකාධිකරණ ශිල්පීය ආයතනය**

# පරීක්ෂක වාර්තාව

AA2 විභාගය - ජනවාරි 2020

## (AA25) ව්‍යාපාර නීතිය හා ආචාරධර්ම

(Business Law and Ethics)

---

## A - කොටස

### ප්‍රශ්න අංක 01

මෙම ප්‍රශ්නය ලකුණු 20 ක් සඳහා වූ වාස්තවික ප්‍රශ්න 10 කින් සමන්විත විය.

අයදුම්කරුවන්ගෙන් බහුතරයක් මෙම ප්‍රශ්නයට උත්තර ලියා තිබුණේය. බොහොමයක් අයදුම්කරුවන් ප්‍රශ්නයට වෙන් කළ මුළු ලකුණුවලින් ඉහළ ලකුණු ප්‍රමාණයක් ලබාගෙන තිබුණි.

අයදුම්කරුවන්ගෙන් සැලකිය යුතු පිරිසකට ප්‍රශ්න අංක 1.9 සඳහා නිවැරදි උත්තරය ලිවීමට අපොහොසත් වූ බව පෙනී ගියේය. මෙම ප්‍රශ්නය සුරැකුම්පත් සහ විනිමය කොමිෂන් සභාවේ කාර්යන් පිළිබඳව පරීක්ෂා කරන ලදී. අයදුම්කරුවන්ගෙන් සාමාන්‍ය ප්‍රමාණයක් මේ සඳහා උත්තර ලියා නොතිබුණි. සමහරක් අයදුම්කරුවන් සම්පූර්ණයෙන්ම අදාල නොමැති උත්තර ලියා තිබුණි.

අයදුම්කරුවන්ට ශ්‍රී ලංකාවේ නීති හා නියාමන රාමුව පිළිබඳ මනා අවබෝධයක් තිබිය යුතුය. ස්ව-අධ්‍යයනය පාඩම්මාලා තුළින් ජාත්‍යන්තර වෙළඳාම, ගිවිසුම් නීතිය හා භාණ්ඩ විකිණීම පිළිබඳ මනා දැනුමක් ලබා ගත හැකි අතර **A කොටස** සඳහා ඉහළ ලකුණු ලබාගැනීම සඳහා මෙය උපකාරී වේ. එම නිසා සමත්වීමට අවශ්‍ය ලකුණු ලබා ගැනීමට මෙය මහත්සේ දායක වේ.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## B කොටස

### ප්‍රශ්න අංක 02

මෙම ප්‍රශ්නය හවුල් ව්‍යාපාර නීතිය පිළිබඳ පාදක වූ අතර හවුල්කරුවන්ගේ කාර්යභාරය හා වගකීම් දෙන ලද සිද්ධිදාමකට අදාලව පරීක්ෂාකර ඇත. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය අවබෝධ කරගෙන තිබූ අතර සොයිසාගේ කාර්යභාරය හා පෙරේරාගේ නීතිමය අයිතිය පැහැදිලි කර තිබුණි. සුළුතර අයදුම්කරුවන් පිරිසක් පමණක් නිවැදි උත්තරය ලබා දී නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

### ප්‍රශ්න අංක 03

මෙම ප්‍රශ්නය ඍජු න්‍යායාත්මක දැනුම පරීක්ෂා කරන ලද ප්‍රශ්නයකි. මෙම ප්‍රශ්නය මඟින් ගණකාධිකරණ වෘත්තියට අදාලව අචාරධර්මයන් පිළිබඳ දැනුම පරීක්ෂාකරන ලදී. මෙම ප්‍රශ්නය ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත පරිශීලනය කිරීමේ දැනුම පරීක්ෂාකර ඇති අතර බොහොමයක් අයදුම්කරුවන් මේ සඳහා උත්තර ලිවීම මඟහැර තිබුණි. මෙමඟින් විභාගයට පෙනී සිටීමට පෙර ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත් පරිශීලනය නොකළ බව පෙනී ගියේය.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවිය.**

## ප්‍රශ්න අංක 04

මෙය ජාත්‍යන්තර වෙළඳාම සම්බන්ධ සරල සෘජු ප්‍රශ්නයකි.මෙමගින් නෞභාරපතක කාර්යයන් පිළිබඳ දැනුම පරීක්ෂාකරන ලදී. සුළු අයදුම්කරුවන් පිරිසක් පමණක් මේ සඳහා උත්තර ලියා තිබුණි. කෙසේ වෙතත්, ප්‍රශ්නය හරිහැටි කියවීමෙන් තොරව නෞභාරපත යන්න අර්ථකකථනය කර තිබුණි. තවත් සමහරක් අයදුම්කරුවන් මේ සඳහා උත්තර ලිවීම මගහැර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## ප්‍රශ්න අංක 05

මෙම ප්‍රශ්නය මගින් නියෝජිත නීතිය පිළිබඳ දැනුම පරීක්ෂාකර තිබුණි. බොහොමයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය සඳහා උත්තර ලියා තිබුණි. තවද ප්‍රධානියා සහ නියෝජිතයා අතර සම්බන්ධතාව පැන නගින ආකාර ලියා මුළු ලකුණු ලබාගෙන තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 06

මෙම ප්‍රශ්නය සෘජුවම ස්ව-අධ්‍යයනය පාඩම්මාලා පොතින් පරීක්ෂාකර ඇත.

මෙම ප්‍රශ්නය සෘජුවම ස්ව-අධ්‍යයන පාඩම්මාලා පොත පරිශීලනය පිළිබඳව පරීක්ෂාකර ඇත. බිල්පතක යථාකාල බාරකයෙකු වීමට සම්පූර්ණ කළ යුතු අවශ්‍යතා පැහැදිලි කරන ලෙස ඉදිරිපත්කර ඇති අතර බහුතරයක් අයදුම්කරුවන් මෙම ප්‍රශ්නය අවබෝධකරගෙන නොතිබුණි.

කෙසේ වෙතත් සමහර අයදුම්කරුවන් ප්‍රශ්නයෙන් අසන දේ පිළිබඳ සැලකිලිමත් නොවී බිල්පතක් යන්නෙහි අදහස, බිල්පතක ප්‍රයෝජන ආදිය ලියා තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක නොවීය.**

## C කොටස

## ප්‍රශ්න අංක 07

මෙම ප්‍රශ්නයෙන් රක්ෂණ නීතිය පිළිබඳ දැනුම පරීක්ෂාකරන ලදී. බොහොමයක් අයදුම්කරුවන් ඔවුන්ගේ න්‍යායාත්මක දැනුම උපයෝගීකර ගනිමින් **(a) කොටස** හා **(b) කොටස** සඳහා උත්තර ලියා මුළු ලකුණු ලබාගෙන තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය ඉතාමත් සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 08

මෙය කම්කරු නීතිය පිළිබඳ වූ සරල ප්‍රශ්නයකි.

**(a)** **කොටස** - බොහොමයක් අයදුම්කරුවන් මෙම කොටසට උත්තර ලිවීම මගහැර ඇති අතර සමහරක් අයදුම්කරුවන් අදාල නැති උත්තර ලියා තිබුණි.

**(b)** **කොටස** - මෙය පාරිතෝෂිකය ගණනය කිරීම පිළිබඳ වූ කොටසකි. සෑම අයදුම්කරුවෙක්ම පාහේ නිවැරදි ගණනය කිරීම සිදුකර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## ප්‍රශ්න අංක 09

මෙය මුදල් විශුද්ධිකරණය හා බුද්ධිමය දේපල පිළිබඳ වූ සෘජු හා සරල ප්‍රශ්නයකි.

**(a)** **කොටස** - සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් මේ කොටස සඳහා නිවැරදි උත්තර ලියා තිබුණි. සමහරක් අයදුම්කරුවන් කරුණු 1 ක් හෝ 2 ක් විවිධ ආකාරයෙන් ලියා තිබූ අතර ඔවුන්ට වෙන්කළ මුළු ලකුණු ලබාගත නොහැකි විය.

**(b)** **කොටස** - මෙම කොටස බුද්ධිමය දේපල පනත පිළිබඳවය. ලකුණු හා වෙළඳනාම යන පද පැහැදිලි කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

## <u>D කොටස</u>

## ප්‍රශ්න අංක 10

**මෙය කොටස් දෙකකින් සමන්විතය.**

**A කොටස** - මෙය ගිවිසුම් නීතිය පිළිබඳ වූ කොටසකි.

**(a)** බහුතරයක් අයදුම්කරුවන් මෙය වලංගු ගිවිසුමක් නොවන බවත් මෙය අර්පණයක් නොවන බවත් එය ගිවිසුම්ගත වීමට කරන ආරාධනයක් බවත් සඳහන් කර තිබුණි.

**(b)** සැලකිය යුතු අයදුම්කරුවන් පිරිසක් අදාල නැති උත්තර ලියා තිබූ අතර ඔවුන් මෙහි හරය වන ගිවිසුම් නීතියට අදාල අවනිශේදනය (misrepresentation) යන්න හඳුනාගෙන නොතිබිණි. නමුත් සමහර අයදුම්කරුවන් සාරාට සංචාරක සමාගමෙන් වන්දි ඉල්ලා සිටිය හැකිය යන්න නිවැරදිව පැහැදිලි කර නොතිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සාමාන්‍ය මට්ටමක විය.**

**B කොටස** - මෙය භාණ්ඩ විකිණීමේ ආඥා පනත පිළිබඳ පාදක කොටගත් ප්‍රශ්නයකි.

මෙම සිද්ධිය, භාණ්ඩ විකිණීමේ ආඥා පනතේ එක් ව්‍යංග කොන්දේසියක් වන "විකුණුම්කරුට භාණ්ඩ විකිණීම සඳහා පරම අයිතියක් තිබිය යුතුය" යන්න පිළිබඳව පාදක වී ඇත.

බහුතරයක් අයදුම්කරුවන් මෙම කොන්දේසිය හඳුනාගෙන හොඳින් පැහැදිලි කර තිබුණි.

**මෙම ප්‍රශ්නය සඳහා සමස්ත කාර්යසාධනය සතුටුදායක මට්ටමක විය.**

\- - -

**විභාග අයදුම්කරුවන් ගේ සාධන මට්ටම දියුණු කර ගැනීමට සැලකිල්ල යොමුකළ යුතු පොදු කරුණුඃ**

(1) නව විෂය නිදේශය පූර්ණ වශයෙන් හොඳින් අධ්‍යයනය කර තිබීම හා නව විෂය කරුණු පිළිබඳ වැඩි අවධානයක් යොමු කිරීම.

(2) ප්‍රශ්නය කිහිපවරක් කියවා බලා නිශ්චිත ඍජු උත්තර සැපයීම කළ යුතු අවස්ථාවලදී අනවශ්‍ය පැහැදිලි කිරීම් / විස්තර ලිවීම් නොකළ යුතුය.

(3) කළයුතු ක්‍රියා පරීක්ෂා ලැයිස්තුව විභාගයට පෙර මැනවින් අධ්‍යයනය කිරීම සහ ප්‍රශ්න තුල භාවිත කර ඇති කළයුතු ක්‍රියාව තුලින් බලාපොරොත්තුවන උත්තර ක්‍රියා නිර්වචනයට අනුකූලවන ලෙස මැනවින් ඉදිරිපත් කිරීම.

(4) ස්ව-අධ්‍යනය පාඩම්මාලාව සහ මෙම විෂයට අදාල ග්‍රන්ථ, අත්පොත්, ලිපි, සඟරා ආදිය මැනවින් පරිශීලනය කිරීම

(5) උත්තර ලිවීමේදී මූලික න්‍යායාත්මක සංකල්ප නිවැරදිව හඳුනාගනීමට හා සංසන්දනාත්මකව විමසීමට අවශ්‍ය කුසලතා ගොඩ නැගීම.

(6) අත් අකුරු කියවිය හැකි ආකාරයටත් ප්‍රශ්න අංක නිවැරදිව නිසි පරිදි යෙදීමටත් කටයුතු කළ යුතුය.

(7) ප්‍රශ්න පත්‍රයේ දී ඇති උපදෙස් නිවැරදිව පිළිපැදීම.

(8) පසුගිය විභාග ප්‍රශ්න පත්‍ර හා උත්තර පරිශීලනය කිරීමෙන් තම දැනුම ප්‍රගුණ කළ හැකිය.

(9) ව්‍යාපාර නීතිය හා අචාරධර්ම පිළිබඳ නිවැරදි අවබෝධයක් ලබා ගැනීම තුළින් එකිනෙක නීතිමය සංකල්ප ප්‍රායෝගික භාවිතයන්ට යොදවමින් ඒවා අතර ඇති වෙනස සංසන්දනාත්මකව ගොනු කිරීමේ හැකියාව තිබිය යුතුය.

(10) කාලය මනාව කළමනාකරණය කර ගැනීම.

(11) උත්තර පත්‍ර භාරදීමට පෙර ප්‍රශ්න අංක /විභාග අංකය ආදිය නිසිපරිදි යොදා තිබේදැයි නැවත පරීක්ෂාකර බැලීම.

(12) පෙර සූදානමක් සහිතව විභාගය සමත්වීමේ පරම චේතනාවෙන් ඉදිරිපත් වීම.

- * * * -